පොදු චක්‍රලේඛ ලිපි අංක:- 02 - 73/2013

මගේ අංකය :- ටීඑ/එස්ජ්/12/2006 (II),
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ-10.
2013.04.19

සියළුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
සියළුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ජර්බීය අමාත්‍යාංශයට අයත්
ශ්‍රී ලංකා ජාතික රෝහලේ අධ්‍යක්ෂ,
ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන් ඇතුළු
සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

**අතුරු වෛද්‍ය සේවාවේ දීමනා සංශෝධනය කිරීම.**

සෞඛ්‍ය සේවයේ නියුතු අතුරු වෛද්‍ය සේවාව සඳහා දැනට ගෙවනු ලබන පහත සඳහන් දීමනා භාණ්ඩාගාර ලේකම්ගේ අංක DMS/CI/01/12 - VOL. I දරණ 2013.01.23 දිනැති ලිපිය හා අංක DMS/CI/01/13 - VOL. i දරණ 2013.04.16 දිනැති ලිපි අනුව 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංශෝධනය කරනු ලැබේ. ඒ අනුව,

1. **"ඇමතුම් දීමනාව" (On Call Allowance)**

සේවය කරනු ලබන ස්ථානය ගැන නොතකා අතුරු වෛද්‍ය සේවයේ බන්තු රේඛන ශිල්පී හා විද්‍යුත් නිකර්පණ රේඛන සටහන්කරු යන තනතුරු දෙක සඳහා පමණක් ඇමතුම් දීමනාව මසකට රුපියල් 1000/= වේ.

2. **"අනතුරු දීමනාව"**

අතුරු වෛද්‍ය සේවාව සඳහාද අනතුරු දීමනාව කාණ්ඩ 2 ක් යටතේ පහත පරිදි ගෙවනු ලැබේ.

| | රෝහල / ඒකක | අතුරු වෛද්‍ය සේවා සඳහා මසකට |
|---|---|---|
| කාණ්ඩ 01<br>මේ වන විට අනතුරු දීමනාව ගෙවනු ලබන ඒකක | ලාදුරු රෝහල, ලය රෝහල, මානසික රෝහල / ඒකක, පිළිකා රෝහල/ ඒකක, දැඩි සත්කාර ඒකකය (වෛද්‍ය - ශල්‍ය සහ හෘද රෝග හා වෙනත් හදිසි ඒකක), විකිරණ අංශය, වෙනත් රෝහල්වල පවතින ක්ෂය රෝග වාට්ටු, හදිසි ප්‍රතිකාර ඒකක (වෛද්‍ය), හදිසි ප්‍රතිකාර ඒකක (හදිසි අනතුරු) | රුපියල් 400/- |
| කාණ්ඩ 02<br>අළුතින් හඳුනාගනු ලැබූ ඒකක | ලිංගාශ්‍රිත රෝග මර්දන ඒකක සහ එම සායන, රක්තානු ප්‍රතිකාර ඒකක / වාට්ටු (වකුගඩු වාට්ටු / ඒකක), ලේ බැංකුව, නොමේරූ ළදරු ඒකක, සූතිකාගාර සහ සූතිකාගාර ඒකක, මධ්‍යම විෂබීජහරණ ඒකක, චර්ම රෝග වාට්ටු හා සායන, බෝවන රෝගීන් සඳහා වෙන් කර තබන වාට්ටු / ඒකක, ළදය චිකිත්සාගාරය, ස්නායු ශල්‍ය ඒකක, ශල්‍යාගාර, ආසාදන පාලන, රසායනාගාර | රුපියල් 300/- |

3. "අතිකාල රාජකාරි දීමනාව"

මෙතෙක් ක්‍රියාත්මක කරනු ලැබූ අතිකාල ගණනය කිරීම පහත පරිදි සංශෝධනය කර ඒ ඒ ශ්‍රේණීන්ට [illegible] දක්වා ඇති මුදල අතිකාල දීමනා ලෙස පැයකට ගෙවිය යුතු වේ.

| ශ්‍රේණිය | අතුරු වෛද්‍ය සේවයේ නිලධාරීන් සඳහා පැයකට |
|---|---|
| III ශ්‍රේණිය | රුපියල් 90/- |
| II ශ්‍රේණිය | රුපියල් 115/- |
| I ශ්‍රේණිය | රුපියල් 165/- |
| විශේෂ ශ්‍රේණිය | රුපියල් 190/- |

4. "ගමන් වියදම් සහ නිල ඇඳුම් දීමනා"

අතුරු වෛද්‍ය සේවාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්ගේ ගමන් වියදම් හා නිල ඇඳුම් දීමනා 2013.07.01 දින සිට ක්‍රියාත්මක වන සේ පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇති අතර ඒ අනුව ගෙවීම් කළ යුතුය. එමෙන්ම නිල ඇඳුම් දීමනාවේ 2013 වර්ෂයේ දෙවන වාරිකය සංශෝධිත දීමනාව අනුව ගෙවිය යුතුවේ.

| තනතුරු නාමය | ගමන් වියදම් දීමනා | | නිල ඇඳුම් දීමනා | |
|---|---|---|---|---|
| | ගෙවනු ලබන දීමනා | සංශෝධිත දීමනා | අනුමත දීමනා | සංශෝධිත දීමනා |
| මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරී | රු.1250/- | රු.1750/- | රු.10000/- | රු.13000/- |
| පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී | රු.250/- | රු.750/- | රු.10000/- | රු.12000/- |

මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සහ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ එකඟතාවය පරිදිය.

වෛද්‍ය වයි.ඩී. නිහාල් ජයතිලක,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

පිටපත්:- 1. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය - දැන ගැනීම සඳහා
2. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැන ගැනීම සඳහා